මීනුවන්ගොඩ නගර සභාව
-----------------------------
ගම්පහ දිස්ත්‍රික්කය
--------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර **එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ** විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 25 දින ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-----------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට මීනුවන්ගොඩ නගර සභාවේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.
-------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
---------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු ට්‍රැක්ටරයක් 2013 මැයි 22 දින රු. 155,555 ක වටිනාකමකට විකුණා තිබුණද, මෙම රථයේ පිරිවැය වූ රු.215,500 ක් මෝටර් රථ හා කරත්ත ගිණුමෙන් ඉවත්කර නොතිබුණි.

(ආ) ස්ථාවර වත්කම් ලේඛනය අනුව සභාව සතු ත්‍රිරෝද රථ 03 න් එක් ත්‍රිරෝද රථයක වටිනාකම ගිණුම්ගත කොට නොතිබුණි.

(ඇ) ස්ථාවර වත්කම් ලේඛනය අනුව බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියෙන් පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු.2,000,000ක් වටිනා ට්‍රැක්ටරය සහ ටේලරය ගිණුම්ගත කොට නොතිබුණි.

(ඈ) 2017 දෙසැම්බර් 31 දිනට නගර සභාවේ පුස්තකාලය සඳහා ලැබී තිබූ රු.77,695ක් වටිනා පරිත්‍යාග පොත් ගිණුම් ගත කොට නොතිබුණි.

(ඉ) තැන්පත් කරන ලද රු.17,145 වටිනා චෙක්පතක් 2017 දෙසැම්බර් 31 දින අගරු වී තිබුණද ගිණුම්වල ඊට අදාල සටහන් තබා නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ බලපත්‍ර ගාස්තු බිල් කළ ආදායම තුළ වෙනත් ආදායම් රු.564,130 ක් ඇතුලත්ව තිබීම නිසා බලපත්‍ර ගාස්තු බිල් කළ ආදායම වැඩියෙන්ද වෙනත් ආදායම් අඩුවෙන්ද දක්වා තිබුණි.

1.3.2 නොසැසඳුණු ගිණුම්

-------------------------

ණය හිමි ගිණුම් 02 කට අදාලව ගිණුම් හා උපලේඛන අතර 2017 දෙසැම්බර් 31 දිනට රු.676,127 ක වෙනසක් විය.

2. මූල්‍ය සමාලෝචනය

----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.35,316,728 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.24,044,315 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

-------------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්,රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු.000` | රු.000` | රු.000` | රු.000 ` | රු.000` | රු.000` | රු.000` | රු.000 ` |
| i | වරිපනම් හා බදු | 10,525 | 10,652 | 10,833 | 5,949 | 9,855 | 10,145 | 11,607 | 8,262 |
| ii | බදු කුලී | 21,640 | 19,426 | 19,599 | 946 | 20,345 | 20,784 | 21,076 | 1,175 |
| iii | බලපත්‍ර ගාස්තු | 532 | 1,137 | 576 | 05 | 1,152 | 1,118 | 1,154 | 11 |
| iv | වෙනත් ආදායම් | 17,261 | 31,361 | 28,444 | - | 12,530 | 21,852 | 19,652 | - |

2.2.2 වරිපනම් හා බදු

-------------------

(අ) වරිපනම්

----------

(i) 2017 ජනවාරි 01 දිනට වූ වරිපනම් හා බදු හිඟයෙන් සමාලෝචිත වර්ෂයේ අයකර තිබූ මුදල රු.5,715,899 ක් වූ අතර එම අයකිරීම් ප්‍රතිශතය සියයට 69 ක් වූයෙන් අයකිරීම්වල ප්‍රගතිය අඩු මට්ටමක පැවතුණි.

(ii) රු.5,000 ට වඩා වැඩි වරිපනම් හිඟ දක්වා තිබූ ආයතන හා පුද්ගල සංඛ්‍යාව 246 ක්වූ අතර, 2017 දෙසැම්බර් 31 දින වනවිට එම හිඟ මුදල රු.3,441,312 ක් වී තිබුණි. මෙම හිඟ අයකර ගැනීම සඳහා නගර සභා ආඥාපනතේ 170 (1) වගන්තිය ප්‍රකාරව පියවර ගෙන නොතිබුණි.

(iii) වරිපනම් ඒකක 22ක් වසා තැබීම් මත සමාලෝචිත වර්ෂයේ රු. 170,806 ක වරිපනම් බදු වටිනාකමක් කපා හැර තිබූ අතර එම ඒකක වසා තැබූ බවට සභාව විසින් තීරණය කිරීමේදී ඊට අදාළ ග්‍රාම සේවා නිලධාරිගේ නිර්දේශයක් ලබාගෙන නොතිබුණි.

2.2.3 බලපත්‍ර ගාස්තු

------------------

වෙළඳ බලපත්‍ර

----------------

ව්‍යාපාර වසා තැබීම් නිසා 09 ක් 2017 වසර සඳහා ආයතන වෙළඳ බලපත්‍ර ලබා ගෙන නොතිබුණද ඒ සම්බන්ධයෙන් ග්‍රාම නිලධාරි නිර්දේශ ලබා ගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

(අ) වායුසමීකරණ යන්ත්‍ර 02 ක් මිලදී ගැනීම වෙනුවෙන් සීමාසහිත රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාව වෙත 2017 දෙසැම්බර් 29 දින නිකුත්කර තිබූ රු.164,000 වටිනා චෙක්පත 2018 මාර්තු 23 දින දක්වාම භාරදීමක් සිදු නොකර 2018 පෙබරවාරි දක්වා බැංකු සැසඳුම්වල ඉදිරිපත් නොවූ චෙක්පතක් ලෙස දක්වා තිබුණි.

(ආ) දිවි නැඟුම සතිපොළ විවෘත කිරීමේදී නොමිලේ ලබා දී තිබූ බව සඳහන් සති පොළ ඒප්‍රන් 200 ක තොගයක් ගබඩාවේ තිබුණද ඒවා ලේඛනගත කර නොතිබුණි.

3.2 ප්‍රසම්පාදනය

---------------

3.2.1 කොන්ත්‍රාත් පරිපාලනය

-----------------------------

(අ) හදිරම හන්දියේ වැසිකිළි පද්ධතියක් ඉදිකිරීම සඳහා රු.5,297,571 ක මුදලකට මාස 02 කින් වැඩ නිම කිරීමට 2016 සැප්තැම්බර් 14 දින ගිවිසුම් ගතවී තිබූ අතර මෙහි අමතර වැඩ සඳහා නැවත රු.494,756 ක මුදලකට මාස 02 කින් නිම කිරීමට 2017 අගෝස්තු 14 දින ගිවිසුම්ගතවී තිබුණි. ඒ අනුව මුළු කොන්ත්‍රාත් වටිනාකම රු.5,792,327 ක් වූ අතර සියළු වැඩ අවසන් ලෙස රු. 4,993,299 ක මුදලක් 2017 ඔක්තෝබර් 09 දිනවන විට ගෙවා තිබුණි. එදිනට කළවැඩවල වටිනාකම රු.4,467,849 ක් වූවද රු.4,993,299 ක් ගෙවා තිබීම නිසා වැඩිපුර ගෙවා තිබූ මුදල රු.525,450 ක් විය. එහෙත් 2017 දෙසැම්බර් 13 දින වනවිටත් මෙම කොන්ත්‍රාත්තුව අවසන්ව නොතිබූ අතර එදිනට පළමු ගිවිසුමේ ප්‍රමාද ගාස්තුව රු.476,781 ක් වූවත් අයකර තිබුණේ රු.211,903 ක් පමණි. තවද දෙවන ගිවිසුමේ ප්‍රමාද ගාස්තුව වන රු.9,895 ක් ද අයකරගෙන නොතිබුණි.

(ආ) රැස්වීම් ශාලාව ඉදිකිරීම සඳහා රු.3,175,332 ක මුදලකට මාස 06 කින් නිම කිරීමට 2016 ජූනි 23 දින ගිවිසුම් ගතවී තිබියදී අතිරේක වැඩ සඳහා රු.1,187,949 ක මුදලකට මාස 03 කින් නිම කිරීමට ඉහත කොන්ත්‍රාත්කරු සමඟ 2017 අප්‍රේල් 11 දින ගිවිසුම් ගතවී තිබූ අතර ඒ සඳහා ඉංජිනේරු නිර්දේශයක් නොතිබුණි.මෙම මුළු කොන්ත්‍රාත්තුව නිම කර තිබුණේ 2017 ජූලි 27 දින වන හෙයින් රු.104,163 ක් වන ප්‍රමාද ගාස්තුව 2018 පෙබරවාරි 28 දින දක්වාම අයකර නොතිබුණි.

(ඇ) වැගොඩ්ව සුසාන භූමියේ මායිම් නියමානුකූල කිරීම සඳහා වැට සකස් කිරීමේ ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වටිනාකම රු.459,050 ක්වූ අතර අවම මිලගණන් මත ගිවිසුම් ගතවූ වටිනාකම රු.447,000 ක් විය. ව්‍යාපෘතියේ සත්‍ය වියදම රු.499,975 ක් වී තිබූ හෙයින් අමතර වැඩ සඳහා ගිවිසුම්ගත ගත වටිනාකම ඉක්මවා රු.52,975 ක් ගෙවීම් කර තිබූ අතර එම විචලතාවය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.3 වගන්තියට පටහැනි වී තිබුණි.

4. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර ලේකම්වරයාගේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතුය.

| | පද්ධතිය | අඩුපාඩුව |
|---|---|---|
| | -------------- | ----------- |
| (අ) | වත්කම් පාලනය | ස්ථාවර වත්කම් ගිණුම් ගතකර නොතිබීම. |
| (ආ) | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | ඇස්තමේන්තු කිරීමේ දුර්වලතා |